# ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති තීරණය කිරීම

# හා

# ක්‍රියාත්මක කිරීම.

**ජාතික විගණන කාර්යාලය**

**කාර්ය පැවරුම් අංකය : ඊඩීයූ/බී/එන්ඊසී/පීඊආර්/2019/1**

| අනු අංකය | විස්තරය | පිටු අංකය |
| --- | --- | --- |
| --------- | ------------ | ------- |
| **1** | විධායක සාරාංශය | **03-05** |
| **2** | පසුබිම | **06** |
| **2.1** | හැඳින්වීම | **06** |
| **2.1.1** | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව | **06** |
| **2.1.2** | ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ගොඩනැංවීම සඳහා පවතින ආයතනික රාමුව | **07** |
| **2.1.3** | නීතිමය ප්‍රතිපාදන | **07** |
| **2.1.4** | මූල්‍ය ප්‍රතිපාදන | **08** |
| **2.1.5** | සබැඳි ආයතන | **08** |
| **2.1.6** | ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය | **08** |
| **2.1.7** | ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති තීරණය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය | **10** |
| **2.1.8** | ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති තීරණය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ පියවරයන් | **11** |
| **2.1.9** | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් මෑත කාලීනව පිළියෙල කර ජනාධිපතිවරයාට ඉදිරිපත් කර තිබූ ප්‍රතිපත්ති ප්‍රකාශන ගොඩනැංවීම හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය | **12-14** |
| **2.2** | විගණනය සඳහා අධිකාරී බලය | **15** |
| **2.3** | විගණනය සඳහා පදනම | **15** |
| **2.4** | විගණන ප්‍රවේශය | **16** |
| **2.5** | විගණන අරමුණු | **16** |
| **2.6** | විගණන නිර්ණායක | **17** |
| **2.7** | විගණන විෂයපථය | **17** |
| **2.8** | විගණන විෂයපථය සීමාවීම | **17** |
| **3** | නිරීක්ෂණ | **18-21** |
| **4** | නිර්දේශ | **22** |

## 1. විධායක සාරාංශය

--------------------

අධ්‍යාපනය යනු පුද්ගලයා තුළ දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය කිරීමේ ක්‍රියාවලියකි. ඉගෙනීම, ඉගැන්වීම, ඇගයීම, රසවිඳීම, පුහුණුව ආදී පුළුල් ක්ෂේත්‍රයකට සම්බන්ධය. එනම් අධ්‍යාපනය පුද්ගල හැකියාවන් උද්දීපනය කර පූර්ණ මිනිසෙකු බිහි කිරීම සඳහා වන පුද්ගල සංවර්ධන ක්‍රියාවලියක් මෙන්ම සමාජ සංවර්ධනය කිරීම පෙරටු කරගත් සමාජ සංවර්ධන ක්‍රියාවලියක් වේ. ශ්‍රී ලාංකීය අධ්‍යාපනය අවුරුදු 2000 ක් තරම් පැරණි ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන අතර ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් අධ්‍යාපනය මූලික අයිතිවාසිකමක් ලෙස ව්‍යවස්ථාගත කොට ඇත.

ළමයින් ජීවත්වන සමාජය ඔවුන්ට තෘප්තිමත් ජීවිතයක් ගතකිරීමටත්, වැඩිහිටියන් සමග එක්ව ඵලදායී ලෙස කටයුතු කිරීම සඳහා සූදානම් කර තැබීම සඳහාත්, ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා නිපුණතාවයෙන් හෙබි ශ්‍රම බලකායක් ස්ථාපිත කර ගැනීම සඳහාත්, උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සඳහා වූ රාමුවක් වර්ධනය කිරීම හෝ නිර්මාණය කිරීම, ගෝලීය වශයෙන් සිදු කෙරෙන ඒ හා සමාන ප්‍රවේශ, ප්‍රවණතා හා අවශ්‍යතා සමගින් අනුකූල වීම සඳහාත්, එබඳු වෙනස්කම් හඳුන්වා දීමට අපේක්ෂා කරනු ලබන දේශීය සමාජීය පසුබිම සැලකිල්ලට ගෙන උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සඳහාත්, ජාතික අනන්‍යතා ආරක්ෂා කර ගනිමින් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ගොඩනැංවිය යුතුය.

සංවර්ධිත සෑම රටක්ම සංවර්ධනයට ළඟාවීමේදී මූලිකවම කෘෂිකාර්මික වශයෙන් ඉහළ සමාජ ආර්ථික වර්ධනයක් අත්පත්කරගෙන පැවතීම මූලික ලක්ෂණයකි. මේ නිසා කලින් කලට විශේෂයෙන් සංවර්ධනය විය යුතු ක්ෂේත්‍ර හඳුනාගෙන එම ක්ෂේත්‍ර සංවර්ධනය සඳහා අධ්‍යාපන ප්‍රතිපත්ති සකස් කිරීම අත්‍යාවශ්‍ය වේ.

1991 අංක 19 දරණ ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ විධිවිධාන ප්‍රකාරව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ගොඩනැංවීම සඳහා ප්‍රතිපාදන සලසා ඇති අතර ඒ සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව පිහිටුවා ඇත. මේ සඳහා ඒකාබද්ධ අරමුදලට අමතරව විදේශ ආධාර ව්‍යාපෘති යටතේද මූල්‍ය ප්‍රතිපාදන සලසාගෙන තිබුණි .

මෙම කාර්යසාධන විගණනයේදී ප්‍රතිපත්ති සැකසීම හා ඒවා අනුමත කිරීම මෙන්ම ක්‍රියාත්මක කිරීම යන කාර්යයන් ඉටුකරනු ලබන ආයතනවල කාර්යයන් සැළකිල්ලට ගන්නා ලදී. එහිදී රටට ඵලදායී ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් ගොඩනැගී පවතින්නේ ද සහ එය ක්‍රියාත්මක තත්වයේ පවතින්නේද යන්නත් එවැනි ප්‍රතිපත්තියක් ගොඩනැංවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා පවතින්නාවූ ජාතික මට්ටමේ අධීක්ෂණ හා පරිපාලන රාමුව ප්‍රමාණවත්ද යන්න පරීක්ෂා කිරීම මූලික අරමුණ විය.

එසේම වාර්ෂිකව විශ්වවිද්‍යාල අධ්‍යාපනයට යොමු කරන සිසුන් ප්‍රමාණය අරමුණු කරගෙන විධිමත් අධ්‍යාපනය ලබාදීම, අ.පො.ස.(සා.පෙළ) විභාගයට ඉදිරිපත්වන සිසුන්ගෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් අ.පො.ස.(උසස්පෙළ) විභාගය සඳහා සුදුසුකම් නොලැබීමත්, එම සුදුසුකම් ලබන සිසුන්ගෙන් අඩු ප්‍රතිශතයක් විශ්වවිද්‍යාල සඳහා සුදුසුකම් ලැබීමත් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබන සිසුන්ගෙන් අඩු ප්‍රතිශතයක් විශ්ව විද්‍යාල වෙත බඳවා ගැනීමත්, ඉන් පිරිමි සිසුන්ගේ ප්‍රතිශතය වඩා පහළ අගයක් ගැනීමත්, සුදුසුකම් නොමැතිව සාමාන්‍ය පෙළ හා උසස් පෙළ අසමත්වන්නන් වාර්ෂිකව ශ්‍රම බලකායට එක්වීමත්, ඔවුන්ට සමාජයට ගැලපෙන කුසලතා හිමි නොවීමෙන් රැකියා හිඟයක් පැවතීම නිසාත් මෙම සිසුන් කොටස සඳහා වෘත්තීය හා නොවිධිමත් අධ්‍යාපනය ලබා දීම අධ්‍යාපන ප්‍රතිපත්තියක් බවට ප්‍රකාශ කළ යුතු තත්වයකට පත්වී තිබුණි. දැනට විවිධ අධ්‍යාපන ආයතන සතුව මේ සඳහා අවශ්‍ය බලතල ඇතත් ඒවා නිසි අධ්‍යාපන ප්‍රතිපත්තියකින් ආවරණය නොවීම නිසා අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ ප්‍රතිපත්තිමය ගැටළු පැනනැගී ඇත.

විවිධ කුසලතාවයන්ගෙන් හෙබි දරුවන්ට ගණිතය සමත්වීමේ අවශ්‍යතාවය මත තමන් කැමතිම ක්ෂේත්‍රයෙන් ඉදිරියට යාමට නොහැකිවීම, තෘතීය හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පවතින පාඨමාලා සඳහා සහභාගීවීමට හැකි සියළු ළමුන් සංඛ්‍යාව සහභාගීකර ගැනීමට එම ආයතනය අපොහොසත්වීම, නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය, සැමට අධ්‍යාපනය ලබා දීමේ ප්‍රතිපත්ති කාලයක සිට රට තුළ ක්‍රියාත්මකව පවතින නමුත් දරුවන්ට අධ්‍යාපනය ලබා දීම සඳහා දෙමාපියන්ට තම ධනයෙන් වැඩි ප්‍රතිශතයක් වැය කිරීමට සිදුවීම සහ පාසැල් විෂයමාලාව සංකීර්ණ වීම නිසා දරුවන්ට, ගුරුවරුන්ට සහ දෙමව්පියන්ට මුහුණපෑමට සිදුව ඇති මානසික අසහනය ආදී ක්ෂේත්‍රය තුළ පවතින ගැටළු හේතුවෙන් එම ගැටළු සඳහා අමතන ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක අවශ්‍යතාවය නිරික්ෂණය විය. ඒ හේතුවෙන් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ගොඩනැංවීම සඳහා ආරම්භකර ඇති ආයතනවල ආයතනික පසුබිම හා නීතිමය රාමුව ගැඹුරින් අධ්‍යයනය කිරීම මෙම විගණනයේ අරමුණ විය.

මෙම විගණන පරීක්ෂාවේදී ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය සම්බන්ධයෙන් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම, අදාළ අනෙකුත් ලියකියවිලි සමාලෝචනය සහ සම්බන්ධිත නිලධාරීන්ගෙන් කරන ලද විමසීම්, පර්යේෂණ වාර්තා පරීක්ෂාව සහ විද්වත් අදහස් සැලකිල්ලට ගැනීම සිදු කරන ලදී.

කොමිෂන් සභාවේ පවතින යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම හා ජොෂ්ඨ, තෘතියික හා ද්විතියික මට්ටම්වල පුරප්පාඩු 14 ක් පැවතීම, වෘත්තීය මට්ටමේ පර්යේෂණ කළ හැකි කාර්ය මණ්ඩලයක් බඳවාගැනීමට හැකි පරිදි සේවා ව්‍යවස්ථා සකස්කරගෙන නොමැති වීම, පර්යේෂකයන් බාහිරෙන් ලබාගැනීමට යාමත් නිසා විවිධ ගැටළු පැනනැගී ඇති බව නිරීක්ෂණය විය. ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සැකසීම සඳහා වූ මූලික නිර්නායක ගොඩනගා නොමැති නිසා කොමිෂන් සභාව ජනාධිපතිවරයාට ඉදිරිපත් කරන නිර්දේෂ ඇතුළත් වාර්තාව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ලෙස ප්‍රකාශයට පත්කිරීමේ ක්‍රියාවලීය සාර්ථකවී නොතිබුණි.

ජනාධිපති ධූරය වෙනස් වීම මත අවුරුදු 5 ක් වූ සමාජික ධූර කාලය වෙනස් වීම ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා ප්‍රධාන බාධාවක් වී තිබුණු බව නිරීක්ෂණය විය. තරුණයන් පිළිබඳ කොමිෂන් සභා වාර්තාවේ 4 වන පරිච්ඡේදය පරිදි ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් පිළිබඳ දස අවුරුදු සැලැස්මක් සකස්කර නොතිබුණු අතර 1997 වර්ෂයෙන් පසු ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් එළි දක්වා නොතිබුණි. එසේම එදා සිට රටේ පැවති විවිධ ආණ්ඩු මාරුවීමත් සමග ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් ප්‍රකාශයට පත් කිරීමේ ඒකාකාරීභාවය ගිලිහී ගොස් තිබුණි.

කොමිෂන් සභාවේ පවතින පුරප්පාඩු සම්පූර්ණකර යටිතල පහසුකම් වර්ධනයකර වඩාත් උචිත වෘත්තීය මට්ටමේ කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර ගැනීමට ක්‍රියාකිරීම හා ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ගොඩනැංවීම සඳහා සුදුසු ප්‍රමිත හා නිර්ණායක සම්පාදනය කර එය ප්‍රකාශයට පත් කිරීම සඳහා ඒකාකාරී ආකෘතියක් හා කාලරාමුවක් ගොඩනඟා ගත යුතුය. එසේම කොමිෂමේ නිර්දේශ වාර්තා අදාල ක්ෂේත්‍රයේ සියළුම පාර්ශව නැවත සමාලෝචනයට භාජනය කර ප්‍රකාශයට පත් කළ හැකි පරිදි සකස්කර ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර ඒ සඳහා රාජ්‍ය යාන්ත්‍රණයක් හා ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සලසා ගත යුතුය. එමගින් නොවෙනස් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් රටට හඳුන්වාදීමට ක්‍රියාකළ යුතුය.

## 2 පසුබිම

## 2.1 හැඳින්වීම

### 2.1.1 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ 4 වන පරිච්ඡේදය ප්‍රකාරව අධ්‍යාපන ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් පොදු එකඟතාවයක් ලැබීම අරමුණු කෙරෙන "අධ්‍යාපන ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ජාතික කොමිෂමක්" පිහිටුවීමේ දැඩි අවශ්‍යතාවය පිළිගෙන ඇත. "එබඳු කොමිසමක් මඟින් වහාම දස අවුරුදු සැලැස්මක් පිළියෙල කිරීමේ කාර්යය ආරම්භ කළ යුතු අතර 1991 වසර තුළ එම සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ කටයුතු ඇරඹිය යුතුය" යන තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ සඳහන් කරුණු පාදක කරගෙන හා වරින් වර ඇතිවන දේශපාලන වෙනස්කම් නිසා කෙරෙන බලපෑම් වලින් බැහැරවූ අධ්‍යාපන ක්‍රමයක් සඳහා ස්ථිර හා නිශ්චිත ප්‍රතිපත්තියක් සකස් කිරීමේ වැදගත්කම හඳුනාගෙන ඒ සඳහා 1991 අංක 19 දරණ ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත යටතේ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව පිහිටුවා තිබුණි.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 2(1) වන වගන්තිය සහ 2(3) වන වගන්තිය ප්‍රකාරව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ජනාධිපතිවරයාට ඉදිරිපත් කරන නිර්දේශ ඇතුළත් වාර්තාව පාදක කරගෙන අධ්‍යාපනයේ සියළු අංශ සම්බන්ධයෙන් වගකිවයුතු සියළු අධිකාරි හා ආයතන විසින් අනුකූලතාවයක් දැක්විය යුතු ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ජනාධිපතිවරයා විසින් කලින් කල ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතුය.

කොමිෂන් සභා පනතේ 4(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ සංයුතියට නිත්‍ය සාමාජිකයන් දෙදෙනෙකු සහ අධ්‍යාපනය, පරිපාලනය, කළමනාකරණය යන ක්ෂේත්‍රවල හැකියාවක් ඇති තැනැත්තන් 10 දෙනෙකුද ඇතුළත්ව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් 13 දෙනෙකුත්, පනතේ 5 වන වගන්තිය යටතේ පත් කරනු ලබන සභාපතිවරයා සහ උප සභාපතිවරුන් දෙදෙනකුගෙන්ද සමන්විත වේ. ( ඇමුණුම් අංක 01) ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්යමණ්ඩලය සංයුතිය (ඇමුණුම් අංක 02) දැක්වේ. රුපියල් 760,500 ක මාසික කුලි පදනමට නුගේගොඩ නාවල පාරේ අංක 126 දරන ස්ථානයේ පවත්වා ගෙන යනු ලබන ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව පවතින ඉඩකඩ සීමාවීම හේතුවෙන් අවශ්‍යතාවයට සරිලන සුදුසු ස්ථානයක් පරික්ෂා කරමින් සිටී . වරින්වර ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව අධ්‍යාපන අමාත්‍යාංශය යටතට පත් කිරීම සහ කොමිෂන් සභාවට සාමාජිකයන් පත්කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් කොමිෂන් සභාව සහ ස්ථාවර කමිටු විශාල කාලයක් අක්‍රීය ව පැවතීම නිසා කොමිෂන් සභාවේ කටයුතු වරින් වර අක්‍රිය වී තිබුණි.

### 2.1.2 ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ගොඩනැංවීම සඳහා පවතින ආයතනික රාමුව

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

↓

පවතින ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සමාලෝචනය,
නවයෝජනාවලියක් සැකසීම හා පිලිගැන්වීම

↓

ජනාධිපතිවරයා

↓

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය කලින් කලට ප්‍රකාශයට පත්කිරීම,
අධ්‍යාපනයට සම්බන්ධ සියලු ආයතන වෙත ඉදිරිපත් කිරීම

↓

අධ්‍යාපන අමාත්‍යාංශය, නිපුනතා සංවර්ධන අමාත්‍යාංශය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, විශ්වවිද්‍යාල, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය, වෘත්තීය අධ්‍යාපන ආයතන සහ අනෙකුත් සම්බන්ධිත ආයතන

↓

පවත්නා අධ්‍යාපන ප්‍රතිපත්තිය තුළ අදාල වෙනස්කම්
සිදුකරමින් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

### 2.1.3 නීතිමය ප්‍රතිපාදන

**(අ)** 1991 අංක 19 දරණ ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 2(1), 2(3), 8(1)(අ), (ආ), (ඇ), 8(2), 8(2)(අ), (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ), (උ), (ඌ), (එ) සහ 9 වගන්ති මඟින් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ගොඩනැංවීම පිළිබඳ ප්‍රතිපාදන සලසා ඇත. විස්තර ඇමුණුම් අංක 03 පරිදි විය.

**(ආ)** ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 10(1)(ආ), (ඉ), (ඌ), (එ) සහ (ඒ) යන වගන්ති මඟින් කොමිෂන් සභාවේ බලතල සම්බන්ධ ප්‍රතිපාදන සලසා ඇත. විස්තර ඇමුණුම් අංක 04 පරිදි විය.

### 2.1.4 මූල්‍ය ප්‍රතිපාදන

2018 වර්ෂය සඳහා ශීර්ෂ අංක 12 යටතේ රු. මිලියන 49 ක් ඒකාබද්ධ අරමුදලින් ලබාදී තිබූ අතර ඉන් රු. මිලියන 6 ක් පර්යේෂණ හා සංවර්ධන වියදම් ලෙස ප්‍රතිපත්ති ප්‍රකාශන පිළියෙල කිරීමේ ක්‍රියාවලිය සඳහා වෙන් කර තිබුණි . ඒකාබද්ධ අරමුදලට අමතරව විදේශ ආධාර ව්‍යාපෘති යටතේද ප්‍රතිපාදන සලසාගෙන තිබුණි . විස්තර ඇමුණුම් අංක 05 පරිදි විය.

### 2.1.5 සබැඳි ආයතන

**ජාතික** අධ්‍යාපන ප්‍රතිපත්ති සැකසුම් අධියරේදී මෙන්ම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ අධියරේදී සම්බන්ධිත ආයතන

| **ආයතනය** | **කාර්යභාරය කෙටියෙන්** |
| --- | --- |
| **(අ)** ජනාධිපති ලේකම් කාර්යාලය | ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කිරීම |
| **(ආ)** අධ්‍යාපන අමාත්‍යාංශය | ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා ප්‍රතිපත්ති පිළියෙල කිරීමේ කාර්ය නියෝජනය කිරීම |
| **(ඇ)** උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | |
| **(ඇ)** තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | |
| **(ඉ)** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | |
| **(ඊ)** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | |
| **(උ)** ජාතික අධ්‍යාපන ආයතනය | |
| **(ඌ)** විභාග දෙපාර්තමේන්තුව | |
| **(එ)** අනිකුත් සම්බන්ධිත ආයතන | |

### 2.1.6 ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය

1990 මාර්තු - තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්ථාව මඟින් හඳුන්වාදෙන ලදුව 1991 අංක 19 දරණ ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත මඟින් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ගොඩනැංවීම සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව පිහිටුවා ඇත. ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත ප්‍රකාරව අධ්‍යාපනයේ සියලු අංශ සම්බන්ධයෙන් වගකිව යුතු සියලු අධිකාරීන් හා ආයතන විසින් අනුකූලතාවයක් දැක්විය යුතු ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ජනාධිපතිවරයා විසින් කලින් කලට ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතුය.

1990 මාර්තු - තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්ථාවේ 4 වන පරිච්ඡේදය මගින් හඳුනාගෙන තිබූ නිර්දේශයන් අනුව අධ්‍යාපන ප්‍රතිපත්තිය;

(අ) රැකියා සංවේදී විය යුතු අතර

(ආ) ළමයින්ට නිපුණතා ලබාදීම අරමුණු කරගෙන සකස් විය යුතුය

(ඇ) මේ තුළින් රටේ අරමුදල් උපරිම තත්ත්වයෙන් උපයෝගී කර ගැනීමේ උපාය මාර්ග බිහි විය යුතුය

1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 2(2) වගන්තිය ප්‍රකාරව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට පහත දැක්වෙන කාරණා ඇතුළත් වේ.

(අ) අධ්‍යාපනයේ පරමාර්ථ හා නිෂ්ඨාවන්:

(ආ) පෙරපාසල්, ප්‍රාථමික, ද්විතියික, තෘතියික, උසස්, නොවිධිමත්, අවිධිමත්, වැඩිහිටි, විශේෂ, වෘත්තිය හා ආගමික යන අධ්‍යාපන ක්‍රමයේ ව්‍යුහය;

(ඇ) ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම හා ගුරුවරුන් බඳවා ගැනීම සඳහා වූ ක්‍රම හා නිර්ණායක ඇතුළුව අධ්‍යාපන ආයතන වල පිහිටීම සහ ඒවායේ ව්‍යාප්තිය ;

(ඈ) ඉගැන්වීම් මාධ්‍යය, විෂයමාලා විවිධාංගීකරණය, පෙළපොත් සහ ඉගෙනුම් උපකරණ, ආගමික දැනුම, පිළිපැදීම හා පරිචය ලබන ස්ථානය, තක්සේරු කිරීම හා ඇගයීම, විභාග ක්‍රමය, සහතික, අභිඥාන පත්‍ර සහ ශාස්ත්‍රීය ප්‍රදාන හා සුදුසුකම් පිළිගැනීම, ගුරුවරුන්, උපකාරක අධ්‍යාපන කාර්ය මණ්ඩලය, අධීක්ෂකයන් සහ පරිපාලකයන් ඇතුළුව අධ්‍යාපන සේවා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම,ස්ථාපනය කිරීම, ඔවුන්ගේ විනය පාලනය සහ වෘත්තිය වර්ධනය;

(ඉ) ප්‍රජා සහභාගිත්වය උපයෝගී කර ගැනීම ද ඇතුළුව අධ්‍යාපනය සඳහා වූ සම්පත්; සහ

(ඊ) දිවා ආහාරය, සෞඛ්‍යය හා දන්ත සේවා, ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා ඇතුළුව ඉගෙනීම සඳහා වූ උපකාරක සේවා.

එසේම අන්තර්ජාතිකව කාලීනව එකඟවූ අධ්‍යාපන ඉලක්කයන් ද සැලකිල්ලට ගනිමින් අධ්‍යාපන ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය.

1939 - අධ්‍යාපන ප්‍රඥප්තිය ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපනය සම්බන්ධයෙන් මූලික ආරම්භයක් ලෙස පැවති ප්‍රතිපත්තියක් වන අතර, එම ප්‍රඥාප්තිය මේවන විටත් බලාත්මකව පවතින අතර විශේෂිතවූ පරමාර්ථ අරමුණු ලඟා කර ගැනීම උදෙසා විශේෂිතවූ අණ පනත් ප්‍රතිපත්තීන් ලෙස එක්වී ඇත.

1943 - ගරු සී.ඩබ්ලිව්.ඩබ්ලිව් කන්නන්ගර මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අධ්‍යාපනය සඳහා වූ වාර්තාවට අනුව සෑම දරුවෙකුටම අධ්‍යාපනය සඳහා වූ සම අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම රජයේ ප්‍රතිපත්තිය වී ඇත.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ඔවුන්ගේ සේවා කාලය තුළ සකස් කර ජනාධිපතිවරයා වෙත පිළිගැන්වීමට කටයුතු කර ඇති ප්‍රතිපත්ති වාර්තා මේ සමඟ යා කර ඇති ඇමුණුම 06 හි සඳහන් වේ.

## 2.1.7 ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති තීරණය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය

කොමිෂන් සභාව විසින් ප්‍රතිපත්ති ප්‍රකාශ සකස් කිරීමේදී පහත සඳහන් ක්ෂේත්‍ර කිහිපයක් හඳුනාගෙන ඒ යටතේ ප්‍රතිපත්ති ප්‍රකාශ ඉදිරිපත් කිරීම සිදුකර තිබුණි.


(අ) සාමාන්‍ය අධ්‍යාපනය

(ආ) කාර්මික හා තෘතීය අධ්‍යාපනය

(ඇ) උසස් අධ්‍යාපනය

මේ සඳහා කොමිෂන් සභාව විසින් වෙන වෙනම ස්ථාවර කමිටු තුනක් පිහිටුවා ඇත.

### 2.1.8 ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති තීරණය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ පියවරයන්



## 2.1.9 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් මෑත කාලීනව පිළියෙල කර ජනාධිපතිවරයාට ඉදිරිපත් කර තිබූ ප්‍රතිපත්ති ප්‍රකාශන ගොඩනැංවීම හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති තීරණය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ සලකා බැලීමේදී පසුගිය කාලයේදී ජනාධිපතිවරයාට ඉදිරිපත් කර තිබූ ප්‍රතිපත්ති සඳහා වූ නිර්දේශ වාර්තා කිහිපයක් පිළිබඳව මෙහිදී අවධානයට ලක් විය.

### (අ) 1997- සාමාන්‍ය අධ්‍යාපනයේ ප්‍රතිසංස්කරණ

(i) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපතිවරයා විසින් පත් කර තිබූ ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සමඟ ඒකාබද්ධව හා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 1992 දී ජනාධිපතිවරයාට ඉදිරිපත් කරන ලද ප්‍රථම වාර්තාව පාදක කරගෙන ගොඩනංවන ලද වාර්තාව 1997- ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ලෙස ජනාධිපතිවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලදී. ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ලෙස ප්‍රකාශයට පත්කර තිබූ මෙම වාර්තාව 1999 සිට දිවයින පුරා ක්‍රියාත්මක කර තිබුණි.

(ii) මෙහිදී පළමුවන ශ්‍රේණියේ සිට දහතුන්වන ශ්‍රේණිය දක්වා කාලසීමාව තුළ විධිමත් පාසල් අධ්‍යාපනය පමණක් නොව, පූර්ව ළමා අධ්‍යාපනය, පෙර පාසල් අධ්‍යාපනය, වැඩිහිටි අධ්‍යාපනය, අඛණ්ඩ අධ්‍යාපනය හා විශේෂ අධ්‍යාපනය යන සියළුම ක්ෂේත්‍රයන් සම්බන්ධව ප්‍රතිපත්ති හඳුන්වා දී තිබුණි. මෙම ප්‍රතිසංස්කරණ වර්තමානය වන විටද ක්‍රියාත්මක වෙමින් පවතී.

(iii) ජනාධිපති කාර්ය සාධක බලකායට අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා පරිපාලනය හා සම්බන්ධිත පාර්ශවයන්ද (ඇමුණුම් අංක 07) සම්බන්ධ කරගෙන තිබුණු අතර මෙම කාර්යය ඉටු කිරීමේදී තාක්ෂණික කමිටු 12 ක් සහභාගීකර ගෙන තිබුණි. (ඇමුණුම් අංක 08 ) කමිටු විසින් ඉදිරිපත් කරන ලද යෝජනා එක් රැස් කොට විධායක සාරාංශයක් පිළියෙල කර තිබූ අතර එම වාර්තාව ආශ්‍රයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ එක් එක් අවධියේ දී ඉටු කළ යුතු කාර්යයන් ද, ඒ සඳහා වගකීම පැවරිය යුතු ආයතනද, ක්‍රියාත්මක කිරීමේ කාල සටහනක්ද, යෝජනා කර තිබුණි.

**(ආ) 2016 - සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා**

(i) සමස්ත සාමාන්‍ය අධ්‍යාපනයම ආවරණය කරමින් ක්ෂේත්‍ර 10 ක් පිළිබඳ පර්යේෂණ අධ්‍යයනයන් කිරීම පර්යේෂණ කණ්ඩායම් වෙත භාරදී තිබූ අතර ඔවුන්ගේ වාර්තා විශේෂඥ මණ්ඩලයක් විසින් සමාලෝචනය කර පර්යේෂණ කණ්ඩායම්වල සොයාගැනීම් සහ නිර්දේශයන් උනන්දුවක් ඇති කණ්ඩායම්වලට ඉදිරිපත් කර අදහස් දැක්වීමද සැලකිල්ලට ගෙන ප්‍රතිපත්ති යෝජනා ස්වරූපයට සකස් කර තිබුණි.

(ii) ප්‍රතිපත්ති ප්‍රකාශය 2017 වර්ෂයේදී ජනාධිපතිවරයා වෙත පිළිගන්වා තිබූ අතර ඒ සඳහා සම්බන්ධිත පාර්ශව සහභාගීකරගෙන සාකච්ඡා කර සැලසුම් කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය වෙත 2017 අගෝස්තු මස ඉදිරිපත් කර තිබුණි. 2019 වර්ෂය අවසන් වන විටද මේ සම්බන්ධයෙන් විවිධ සාකච්ඡා පවත්වමින් පැවතුණි.

**(ඇ) 2018 - කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය**

(i) පසුගිය දශකය තුළ මෙරට හා ජාත්‍යන්තරය තුළ සිදු වූ සමාජ ආර්ථික හා තාක්ෂණික වර්ධනය හේතුවෙන් හා වැඩ ලෝකයේ අවශ්‍යතාවන් සහතික කරනු වස් දැනට පවතින ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම හා නව ප්‍රතිපත්ති ප්‍රකාශයක් සම්පාදනය කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන කාර්මික සහ වෘත්තීය අධ්‍යාපන හා පුහුණුව පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශය අදාළ පාර්ශවකරුවන්ගේ වැඩමුලුවක් පවත්වා සාකච්ඡා කිරීමෙන් පසුව විද්වත් කමිටු 9 ක් සහභාගී කරගෙන හඳුනාගත් ක්ෂේත්‍ර යටතේ සමීක්ෂණයන් සිදු කර කෙටුම්පත් කර තිබුණි.

(ii) ජනාධිපතිවරයාට වාර්තාව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2019 අගෝස්තු 28 දින වාර්තාව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. එහිදී අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීම සඳහා කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම පිළිබඳ අදාළ නියෝජිතායතනවලට පැවරෙන ක්‍රියාකාරකම සහ එකී ක්‍රියාකාරකම් නිම කිරීම සඳහා අපේක්ෂිත කාල රාමු සඳහන් කරමින් ක්‍රියාකාරකම් පදනම් කර ගත් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන ලෙස බලධාරීන්ට නියම කර තිබුණි.

(iii) විශේෂ මැදිහත්වීම් අවශ්‍ය, අනපේක්ෂිත කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ඉල්ලීම් හා අභියෝගයන් සපිරීමට යාන්ත්‍රණයක් සම්පාදනය කිරීමට මෙම ප්‍රතිපත්තිය තුළින් යෝජනා වී ඇත.

(iv) ජාතික මට්ටමේදී අධීක්ෂණය තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙත පවරා ඇත.

**(ඈ) 2019 - පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය**

---

(i) 2019 වර්ෂයේදී ඉදිරිපත් කර තිබූ පෙර පාසැල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, පරිපාලනය කළ යුතු පාර්ශවය මධ්‍යම ආණ්ඩුවේ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය ලෙසත් මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණය පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව ජාතික මට්ටමේදී අධීක්ෂණය කළ යුතු බවත් හඳුනාගෙන තිබුණි.

(ii) මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ උපදේශන කමිටුව ස්ථාපිත කිරීමට යෝජනා කර තිබුණි.

(iii) පෙර පාසල් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පරිපාලනය කිරීම සඳහා මධ්‍යම රජයේ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යෝජනා කර තිබුණි.

(iv) මධ්‍යම රජයේ ළමා කටයුතු අමාත්‍යාංශයට උපදෙස් සැපයීම, මඟ පෙන්වීම හා සහාය ලබාදීම මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ උපදේශන කමිටුවේ කාර්යභාරය ලෙස හඳුනාගෙන තිබුණි.

(v) පර්යේෂණ, ආංශික නාභිගත සම්මුඛ සාකච්ඡා සහ විශේෂඥයින්, පර්යේෂකයින්, මුල් ළමාවිය සංවර්ධන වෘත්තිකයින්, රජයේ නිලධාරීන්, පරිපාලකයින් සහ එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතනවල නිලධාරීන්, ජාතික සහ අන්තර්ජාතික ආයතනවල නිලධාරීන්ගෙන් සමන්විත ක්ෂේත්‍රය නියෝජනය කරන කණ්ඩායම් යනාදියෙහි අදහස් හා නිර්දේශ මත පදනම්ව මෙම ජාතික ප්‍රතිපත්තිය ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් කෙටුම්පත් කර තිබුණි. (ඇමුණුම 09)

(vi) මෙම වාර්තාව ජනාධිපතිවරයා වෙත 2019 ඔක්තෝම්බර් 15 දින පිළිගැන්වීමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට යෝජිතව පැවතුණි.

## 2.2 විගණනය සඳහා අධිකාරී බලය

---------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 2.3 විගණනය සඳහා පදනම

-------------------------

**(අ)** අධ්‍යාපනයේ සියලු අංශ සම්බන්ධයෙන් වගකිව යුතු සියලු අධිකාරීන් හා ආයතන ඔවුන්ගේ අධිකාරිය මත විවිධ ප්‍රතිපත්ති තීරණය කර ක්‍රියාත්මක කිරීම සහ විවිධ දේශපාලනික බලමූලාශ්‍ර හරහා එම ප්‍රතිපත්ති වෙනස්වීම වලක්වාගෙන ගුණාත්මක අධ්‍යාපන ප්‍රතිපත්තියක් ඒකාකාරීව පවත්වාගෙන යාම යන අරමුණ පෙරදැරිව මෙම ආයතනය ආරම්භකළද අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ අධිකාරීන් හා ආයතන විසින් ඔවුන්ගේ අධිකාරිය මත විවිධ ප්‍රතිපත්ති තීරණය කර ක්‍රියාත්මක කිරීම සහ විවිධ දේශපාලනික බලමූලාශ්‍ර හරහා එම ප්‍රතිපත්ති වෙනස්වීම දක්නට ලැබීම.

**(ආ)** ස්ථිර විසඳුමක් නොමැති පහත ආකාර ගැටළු කාලාන්තරයක් පුරා අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ දක්නට ලැබීම

**(i)** විෂය නිර්දේශයේ අන්තර්ගතය අධික වීම නිසා නිශ්චිත පාසැල් කාලය තුළ ආවරණය කිරීමට නොහැකිවීමෙන් ගුරුවරුන් සහ දරුවන් පීඩනයට පත් වීමත්, විෂය නිර්දේශය ආවරණය කිරීමට උපකාරක පංති වෙත යොමුවීමත්, දරුවන්ට ක්‍රියාකාරකම්වල යෙදීමට පවතින කාලය සීමිත වීමත්, උපකාරක පංති සඳහා දෙමාපියන්ගේ ධනය සහ කාලය විශාල වශයෙන් වැයකිරීමට සිදුව තිබීමත්.

**(ii)** අධ්‍යාපන, තෘතීය සහ උසස් අධ්‍යාපන ක්ෂේත්‍ර තුළ පාඨමාලා සැලසුම් කිරීමේදී රැකියා වෙළඳපොළ ඉල්ලුමට සරිලන පරිදි පාඨමාලා සැලසුම් නොකිරීම සහ ඒවා කලින් කලට සමාලෝචනයට ලක් නොකිරීම.

**(iii)** තෘතීය හා වෘත්තීය අධ්‍යාපනය සඳහා පවතින රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල පාඨමාලාවල බහුතරයකට සහභාගී වීමට අ.පො.ස.(සා.පෙළ) සමත්වීම සහ ගණිතය විෂය සමත්වීම මූලික සුදුසුකමක් ලෙස සැලකීම නිසා විවිධ කුසලතාවයන්ගෙන් හෙබි දරුවන්ට ගණිතය අසමත් වීම නිසා තමන් කැමතිම ක්ෂේත්‍රයෙන් ඉදිරියට යාමට නොහැකිවී තිබීම.

(iv) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පවතින පාඨමාලා සඳහා සහභාගීවීමට හැකි සියළුම සිසුන් සහභාගීකර ගැනීමට එම ආයතනය අපොහොසත්වීම.

(v) උසස් අධ්‍යාපනයට යොමු වන සුළු පිරිසක් අරමුණු කරගෙන සාමාන්‍ය අධ්‍යාපනය පැවතීම

(vi) ගුණාත්මකභාවයකින් යුතු පෙර පාසැල් අධ්‍යාපනයක් ලබාදීම සඳහා මනා කුසලතාවයක් සහ පුහුණුවක් ඇති ගුරුවරුන් ක්ෂේත්‍රය තුළ නොමැතිවීම.

(ඇ) ඉහත ගැටළු සඳහා වරින් වර කොමිෂන් සභාව විසින් ප්‍රතිපත්ති යෝජනා ඉදිරිපත් කර තිබූ නමුත් එම යෝජනා ක්‍රියාත්මක නොවීම.

## 2.4 විගණන ප්‍රවේශය

පහත සඳහන් ප්‍රවේශ යටතේ මෙම විගණනය සිදු කරන ලදී.

(අ) 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ විධිවිධාන ප්‍රකාරව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය සම්බන්ධයෙන් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම.

(ආ) ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් දැනට ප්‍රකාශයට පත්කර ඇති ප්‍රතිපත්ති ප්‍රකාශ පරිශීලනය කිරීම

(ඇ) විද්වත් අදහස් ලබාගැනීම

(ඇ) මාතෘකාවට අදාලව විශේෂිත කොමිෂන් සභා වාර්තා අධ්‍යයනය

## 2.5 විගණන අරමුණු

මෙම කාර්යසාධන විගණනයේ මූලික අරමුණ වනුයේ, රටට ඵලදායී ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් ගොඩනැගී පවතින්නේ ද සහ එය ක්‍රියාත්මක තත්වයේ පවතින්නේද යන්නත් එවැනි ප්‍රතිපත්තියක් ගොඩනැංවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා පවතින්නාවූ ජාතික මට්ටමේ අධීක්ෂණ හා පරිපාලන රාමුව ප්‍රමාණවත්ද යන්නත් පරීක්ෂා කිරීම වේ.

**2.6 විගණන නිර්ණායක**

---------------------

**(අ)** ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත

**(ආ)** තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව

**2.7 විගණන විෂයපථය**

--------------------

කාලවේලාව හා සම්පත්වල සීමිත භාවය මත මෙම විගණනය ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සැකසීමේ සිට ඒවා ක්‍රියාත්මක වීම තෙක් වන අදියරයන් සඳහා සම්බන්ධවන ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, ජාතික අධ්‍යාපන ආයතනය, අධ්‍යාපන අමාත්‍යාංශය හා මේ හා සම්බන්ධ ජනාධිපති ලේකම් කාර්යාලයේ කාර්යයන් සැලකිල්ලට ගනිමින් මෙම විගණනය සිදු කරන ලදී. මෙහිදී 1997 ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මකවීමේ සිට වර්තමානය වන තෙක් අධ්‍යාපන ක්ෂේත්‍රෙය් ගමන්මග පිළිබඳ මෙහිදී සලකා බලන ලදී.

**2.8 විෂය පථය සීමාවීම**

---------------------

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව ආරම්භ කරන ලද 1991 වර්ෂයේ සිට ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමුකරන ප්‍රතිපත්ති මාලාවන් පිළිබඳ ජනාධිපති ලේකම් කාර්යාලයේ පවතින පැරණි දත්ත හා තොරතුරු සැළකිල්ලට භාජනය කිරීමට අවශ්‍ය වුවද, ජනාධිපති ලේකම් කාර්යාලයේ එම පැරණි දත්ත හා තොරතුරු නොමැතිවීම හේතුවෙන් ජනාධිපති ලේකම් කාර්යාලයේ 2016 වර්ෂයේ සිට පැවති තොරතුරු සහ අධ්‍යාපන කොමිෂන් සභාවේ තොරතුරු මත පදනම්ව මෙම විගණනය සිදුකරන ලදී.

3. **නිරීක්ෂණ**

-----------

(අ) කොමිෂන් සභා පනතේ 2(1) සහ 2(3) වන වගන්ති ප්‍රකාරව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ජනාධිපතිවරයාට ඉදිරිපත් කරන නිර්දේශ ඇතුළත් වාර්තාව පාදක කරගෙන අධ්‍යාපනයේ සියළු අංශ සම්බන්ධයෙන් වගකිවයුතු සියළු අධිකාරි හා ආයතන විසින් අනුකූලතාවයක් දැක්විය යුතු ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ජනාධිපතිවරයා විසින් කලින් කල ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතුය. කෙසේ නමුත් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සැකසීම සඳහා වන මූලික නිර්නායක කොමිෂන් සභාව විසින් සකස්කර නොමැති නිසා කොමිෂන් සභාව විසින් ජනාධිපතිවරයාට ඉදිරිපත් කරන නිර්දේශ ඇතුළත් වාර්තාව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ලෙස ප්‍රකාශයට පත්කිරීම නිසි පරිදි නියාමනයක් සිදු වී නොතිබුණි.

(ආ) කොමිෂන් සභාව විසින් 1992 වර්ෂයේ පිළියෙලකළ පලමු කොමිෂන් සභා වාර්තාව ජනාධිපතිවරයාට ඉදිරිපත් කළ පසු ජනාධිපති විසින් ජනාධිපති කාර්යසාධක බලකායක් පිහිටුවා එම වාර්තාව පදනම්කර ගෙන සකස්කළ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය 1997 වර්ෂයේදී ජනාධිපතිවරයා විසින් ප්‍රකාශයට පත්කර තිබුණි. ඉන් පසුව කොමිෂන් සභාව විසින් ජනාධිපතිවරයා වෙත ඉදිපත්කර තිබුණු අධ්‍යාපන ප්‍රතිපත්ති සඳහා වූ යෝජනා සම්බන්ධව මෙම ක්‍රමවේදය අනුගමනයකර නොතිබුණි.මේ හේතුවෙන් කොමිෂන් සභාව විසින් 1992 වර්ෂයට පසුව ඉදිරිපත් කර තිබූ වාර්තා කිසිවක් ප්‍රතිපත්ති ප්‍රකාශ ලෙස ප්‍රකාශයට පත් කර නොතිබුණි.

(ඇ) ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස්කිරීමේදී ඒ සඳහා අධ්‍යාපනයේ සියළු අංශ සහභාගීකරගත යුතු බවට උපදේශයක් හෝ මඟපෙන්වීමක් පනත තුළින් ලබාදී නොතිබුණි. ඒ හේතුවෙන් 2016 වර්ෂයේ ඉදිරිපත් කරන ලද සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සඳහා යෝජනා, කොමිෂන් සභාව විසින් ජනාධිපතිවරයාට 2017 වර්ෂයේදී ඉදිරිපත් කිරීමෙන් පසු කොමිෂන් සභාවේ විද්වත් මණ්ඩලය, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් ප්‍රමුඛ අනෙකුත් අදාල පාර්ශවයන් හා සම්පත්දායකයින් සම්බන්ධීකරණයකර එකී කටයුතු කඩිනම්ව සැලසුම්කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා නැවත ඉදිරිපත්කරන ලෙස ජනාධිපති අතිරේක ලේකම් විසින් 2017 දෙසැම්බර් 27 දින කොමිෂන් සභාවේ ලේකම් වෙත දන්වා තිබුණද එම කාර්යය සිදුවී නොතිබුණි.

**(ඇ)** ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවෙන් 2003, 2016 වර්ෂවල ඉදිරිපත් කළ වාර්තා වල ඇතුළත් පහත දැක්වෙන සාධනීය නිර්දේශ, ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සඳහා අනුකූලතාවයක් දක්වන රජයේ ආයතන විසින් ක්‍රියාත්මක කර තිබුණි. එම වාර්තා ප්‍රතිපත්ති වශයෙන් ප්‍රකාශයට පත් කළේ නම් එම නිර්දේශ වඩාත් සාර්ථකව ඒවා ක්‍රියාත්මක කිරීමට ඉඩකඩ තිබුණ බව නිරීක්ෂණය විය.

**(i)** Z - Score ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

**(ii)** ප්‍රාථමික ශ්‍රේණිවල අඩංගු සියළු කරුණු ඇතුළත් ප්‍රශ්න පත්‍රය වෙනුවට ප්‍රාථමික අධ්‍යාපනයෙහි දැනට ක්‍රියාත්මක කෙරෙන විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ ප්‍රාථමික අධ්‍යාපනය අවසාන පරීක්ෂණය සඳහා හඳුනාගත් අත්‍යාවශ්‍ය ඉගෙනුම් නිපුණතා ඇගයීමේ ප්‍රශ්ණ පත්‍රයක්, අත්‍යාවශ්‍ය ඉගෙනුම් නිපුණතා දැනුම, කුසලතා, ආකල්ප සහ සාරධර්මයන් ක්ෂේත්‍රයන් තුළට සම්බන්ධ හැකියාවන්ගෙන් සමන්විත වීම.

**(iii)** පහ වසර ශිෂ්‍යාධාරය රු.500/- දක්වා වැඩි කිරීම.

**(iv)** අවුරුදු 5–16 දක්වා ළමුන් අනිවාර්ය පාසල් පැමිණීමේ විධිවිධාන සංශෝධනය කිරීම.

**(v)** ඉගැන්වීමේ මාධ්‍ය ප්‍රාථමික අවධියේදී මව් භාෂාව, වාචික ඉංග්‍රීසි සහ 1, 2,3,4 හා 5 ශ්‍රේණිවලදී විධිමත් ඉගැන්වීම ශක්තිමත් කිරීමේ ක්‍රියාවලිය හා ද්විතියික අවධියේදී ඉංග්‍රීසි භාෂාවටද සම අවස්ථා ලබාදීමත් සිදු කළ යුතුය යන්න ජාතික අධ්‍යාපන ආයතනය විෂය මාලා සැකසීමේදී සැලකිල්ලට ගෙන තිබීම.

(ඉ) 2018 වර්ෂයේදී පිළියෙල කර 2019 වර්ෂයේදී ජනාධිපතිවරයාට ඉදිරිපත් කරන ලද කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති වාර්තාව කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ලෙස ප්‍රකාශයට පත්කර නොතිබුණු අතර සමස්ථ ක්ෂේත්‍රයම ආවරණය වන පරිදි, කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු සංවර්ධන සැලැස්මක් මෙම ප්‍රතිපත්ති ප්‍රකාශය පාදක කරගෙන සකස් කර 2020 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමට යෝජනා වී තිබුණද එසේ සිදුකර නොතිබුණි.

(ඊ) තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ 4 වන පරිච්ඡේදයේ සඳහන් නිර්දේශයන් ප්‍රකාරව පිහිටුවන ලද ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය පිළිබඳ දස අවුරුදු සැලැස්මක් පිළියෙල කිරීමේ කාර්යය සිදු කළ යුතු බව දක්වා තිබූ නමුත් කොමිෂන් සභාව විසින් ආරම්භක වාර්තාව **1992** දී ද නැවත සාමාන්‍ය අධ්‍යාපනයේ ප්‍රතිසංස්කරණ යෝජනා 2003 සහ 2016 වර්ෂ වලදී ද, විශ්වවිද්‍යාල අධ්‍යාපනය සම්බන්ධයෙන් 1996,2000 හා 2009 වර්ෂවලදී ද, කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳව 2009 හා 2018 වර්ෂ වලදී ද, පෙරපාසල් අධ්‍යාපනය පිළිබඳව 2019 වර්ෂයේදීද ප්‍රතිපත්ති සඳහා වූ නිර්දේශ ජනාධිපතිවරයාට ඉදිරිපත් කර තිබුණි. මේ අනුව ප්‍රතිපත්ති ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා ඒකාකාරී කාල රාමුවක් ගොඩනගාගෙන නොමැති අතර දස අවුරුදු අධ්‍යාපන සැලැස්මක්ද සකස්කර නොතිබුණි.

(උ) ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමුකරන ලද පසුගිය කාලයට අදාල ප්‍රතිපත්ති යෝජනා පිළිබඳ ක්‍රියාවලිය විමර්ශනය කිරීමට අවශ්‍ය වුවද පැරණි දත්ත හා තොරතුරු ජනාධිපති ලේකම් කාර්යාලය සතුව නොතිබුණි.

(ඌ) කොමිෂම විසින් 2014 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා රු. 14,179,749 ක වියදමක් දරා අධ්‍යාපන ප්‍රතිපත්ති ප්‍රකාශන/ ප්‍රතිපත්ති ප්‍රකාශන යෝජනා ජනාධිපතිවරයාට ඉදිරිපත්කර තිබුණද අධ්‍යාපනයට සම්බන්ධ සියළුම ආයතන අනුකූලතාවයක් දැක්විය යුතු ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් ප්‍රකාශයට පත් නොකිරීම හේතුවෙන් දේශපාලනික මැදිහත්වීම්වලින් තොර ඒකාකාරී ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් පවත්වාගෙන යායුතුය යන කොමිෂන් සභාව ආරම්භ කිරීමේ අරමුණ සාර්ථකව ඉටුවී තිබේද යන්න ප්‍රශ්නකාරී වේ.

(එ) අධ්‍යාපන ප්‍රතිපත්තිය තුළ තිබිය යුතුයැයි කොමිෂන් සභාව හඳුනාගෙන තිබූ නිර්දේශයන් වූ රැකියා සංවේදී බව, ළමයින්ට නිපුණතා ලබාදීම හා රටේ අරමුදල් උපරිම තත්ත්වයෙන් උපයෝගී කර ගැනීමේ උපාය මාර්ග බිහි විය යුතුය යන්න ඉටුවන ලෙසින් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ගොඩනැගී නොමැති බව හා 1939 දී හඳුන්වා දුන් අධ්‍යාපන ප්‍රඥාප්තිය මේවන විටත් බලාත්මකව පවතින බව නිරීක්ෂණය විය.

(ඒ) කොමිෂන් සභා පනතේ 10 (1) ( ඊ ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ සහ වෙනත් රටවල අධ්‍යාපනය සහ ඊට අදාළ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් දත්ත බැංකුවක් පිහිටුවා පවත්වාගෙන යා යුතු වුවත් කොමිෂන් සභාවේ එම කාර්යය අක්‍රියව පවතින බව නිරීක්ෂණය විය.

(ඔ) කොමිෂන් සභාවේ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අදාළ පාර්ශවකරුවන් සමඟ පවත්වනු ලබන වැඩමුළු සඳහා ප්‍රමාණවත් ඉඩපහසුකම් සහ යටිතල පහසුකම් නොමැතිවීම හා ඒ සඳහා බාහිර ශ්‍රවණාගාර වෙන් කරවා ගැනීමේ දී අමතර පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

(ඕ) ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සේවා ව්‍යවස්ථාවට අනුව එහි සේවකයින් සංස්ථාවක/මණ්ඩලයක සේවකයින් සේ සලකා සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායකත්වය සපයනු ලබන අතර ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙනම වැය ශීර්ෂයක් යටතේ භාණ්ඩාගාරයෙන් අයවැය ප්‍රතිපාදන ලබමින් ක්‍රියාත්මක වන ආයතනයක් බැවින් රජයේ අමාත්‍යාංශයක ස්වරූපයෙන් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබයි. මේ හේතුවෙන් අවශ්‍ය අවස්ථාවන්හිදී නිලධාරීන්ගේ වැටුප් වැඩිකිරීම් හා සම්බන්ධව යම් ගැටළුකාරී තත්ත්වයක් පවතින බව නිරීක්ෂණය විය.

**(ක)** කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය නිලධාරීන් 45 ක් වූ අතර දැනට සේවයේ නියුක්ත තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව 28 ක් වූ බැවින් ජ්‍යෙෂ්ඨ, තෘතියික හා ද්විතියික මට්ටම් වශයෙන් පිළිවෙළින් 06, 07 ක් හා 03 ක් වශයෙන් පුරප්පාඩු පැවතුණි. එසේම තනතුරු අනුමත කර ගැනීමේදී කොමිෂන් සභාවේ කාර්යභාරයට අනුකූල වන පරිදි තනතුරු හඳුනා නොගැනීම ආයතනයේ කාර්යසාධනය අවම වීමට බලපෑ හේතුවක් බව නිරීක්ෂණය විය.

(ග) පනතේ 10 (1) (ඌ) වගන්තිය ප්‍රකාරව අධ්‍යාපනයේ විවිධ ක්ෂේත්‍රවල විශේෂඥතා සමූහ මණ්ඩල ගොඩ නංවාලීමට හැකි ලෙස නිලධාරින්ගේ හා සේවකයන්ගේ නිපුණතා වැඩි දියුණු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොමැති නිසාත්, වෘත්තීය මට්ටමේ පර්යේෂණ සිදුකිරිමට හැකි කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම සඳහා ප්‍රමාණවත් වැටුපක් නිර්දේශ වී නොමැති නිසාත්, සුදුසුකම් ලත් බාහිර පර්යේෂකයින් තෝරා ගැනීමට සිදු වී තිබුණි. 2019 වර්ෂයේදී එවැනි පර්යේෂණ කණ්ඩායම් 8 ක් වෙනුවෙන් රු. 3,937,500 ක් වැයකර තිබුණි.

(ජ) තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ 1 වන පරිච්ඡේදයෙන් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සඳහා වූ කොමිෂන් සභාවේ සාමාජිකයින් පත් කිරීම සඳහා නිර්දේශ කිරීම නාමයෝජනා කොමිෂන් සභාව විසින් සිදු කළ යුතු බව දක්වා ඇතත් 2020 වර්ෂය දක්වාම නාමයෝජනා කොමිෂන් සභාව පිහිටුවා නොතිබුණි. අවුරුදු 5 ක් වූ කොමිෂන් සභාවේ සාමාජිකයින්ගේ ධූරකාලය ජනාධිපති ධූරය හා රජයන් වෙනස්වීම මත වෙනස් වීම කොමිෂන් සභාවේ කාර්යසාධනයට බලපා තිබුණි.

## 04 නිර්දේශ

---------

(අ) ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ගොඩනැංවීම සහ ප්‍රකාශයට පත් කිරීම සඳහා සුදුසු ප්‍රමිත හා නිර්ණායක සම්පාදනය කර ඒ සඳහා ඒකාකාරී ආකෘතියක් හා කාලරාමුවක් ගොඩනභා ගත යුතුය.

(ආ) නිර්දේශ වාර්තා පිළියෙල කිරීමෙන් පසුව එම ක්ෂේත්‍රය සම්බන්ධ සියළුම පාර්ශව සහභාගී කරගෙන නැවත එම වාර්තා සමාලෝචනයට භාජනය කර ප්‍රකාශයට පත් කළ හැකි පරිදි සකස්කර ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ හැකි වන ආකාරයට රාජ්‍ය යාන්ත්‍රණයක් හා ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සලසා ගත යුතුය.

(ඇ) ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සම්බන්ධ ජනාධිපති ලේකම් කාර්යාලයේ පවත්නා තොරතුරු ජනාධිපතිවරයා වෙනස්වීමේදී පත්වන නව ජනාධිපතිවරයාගේ කාර්යමණ්ඩලයට ලබාදීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය.

(ඈ) කොමිෂන් සභා පනතේ 10 (1) ( ඊ ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ සහ වෙනත් රටවල අධ්‍යාපනය සහ ඊට අදාළ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් දත්ත බැංකුවක් පිහිටුවා යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය.

(ඉ) වියදම අවම වන පරිදි සහ ඉඩකඩ ප්‍රමාණවත් පරිදි කොමිෂන් සභාව සුදුසු ස්ථානයක ස්ථිරව ස්ථානගත කළ යුතු අතර වෘත්තීය මට්ටමේ පර්යේෂණ සිදු කිරීමට හැකි කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම සඳහා ප්‍රමාණවත් පරිදි සේවා ව්‍යවස්ථාව ගොඩනභා ගත යුතුය.

(ඊ) ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත ප්‍රකාරව කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ ධූරකාලය අවුරුදු 5 ක් වන බැවින් එහි ස්වාධීනත්වය ආරක්ෂාකර ගැනීම සඳහා සාමාජිකයින් පාර්ලිමේන්තුවේ පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ස්වාධීන මණ්ඩලයකින් පත්වීමේ අවශ්‍යතාවය කොමිෂන් සභාව ආරම්භ කිරීමේදී හඳුනාගෙන තිබූ බැවින් ඒ පිළිබඳ ව සැලකිල්ල යොමු කර සාමාජිකයින් පත් කිරීම සඳහා අවශ්‍ය ව්‍යවස්ථාපිතමය ප්‍රතිපාදන සලසා ගත යුතුය.

(උ) කොමිෂන් සභා පනත ප්‍රකාරව ස්වාධීන ආයතනයක් වන කොමිෂන් සභාව 2015 සහ 2019 වර්ෂවලදී අධ්‍යාපන අමාත්‍යාංශය යටතට පත් කර තිබීම පනතට අනුකූල නොවන බැවින් එය වළක්වා ගැනීම සඳහා සුදුසු ව්‍යවස්ථාපිතමය විධිවිධාන සලසා ගත යුතුය.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

2020 ඔක්තෝම්බර් දින

| විස්තරය | ඇමුණුම් අංකය |
| --- | --- |
| ---------- | ------------ |
| කොමිෂන් සභාවේ සංයුතිය | 01 |
| කොමිෂන් සභාවේ කාර්යමණ්ඩලය | 02 |
| ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ගොඩනැංවීම පිළිබඳ නීතිමය ප්‍රතිපාදන | 03 |
| කොමිෂන් සභාවේ බලතල සම්බන්ධ ප්‍රතිපාදන | 04 |
| මූල්‍ය ප්‍රතිපාදන | 05 |
| ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් සම්පාදනය කර ජනාධිපතිවරයා වෙත පිළිගන්වන ලද වාර්තා | 06 |
| ජනාධිපති කාර්යසාධක බලකාය | 07 |
| 1997 වාර්තාව - තාක්ෂණික කමිටුවේ සාමාජිකයින් | 08 |
| මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ උපදේශන කමිටුව | 09 |

ඇමුණුම් අංක **01**

**කොමිෂන් සභාවේ සංයුතිය**

**-----------------------------**

(i) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතින් පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා;

(ii) 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතින් පිහිටුවන ලද වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයා;

(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්;

(iv) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්;

(v) පළාත් සභා විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්;

(vi) අධ්‍යාපනය, පරිපාලනය හෝ කළමනාකරණය යන ක්ෂේත්‍රවල හැකියාවක් දක්වා ඇත්තා වූ හෝ යම් වෘත්තියක විශිෂ්ඨත්වයක් ලබා ඇත්තා වූ තැනැත්තන් අතුරින් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු වෙනත් සාමාජිකයන් දස දෙනෙක් පනතේ 5 වන වගන්තිය යටතේ පත් කරනු ලබන සභාපතිවරයා, උප සභාපතිවරයා (ප්‍රතිපත්ති) සහ උප සභාපතිවරයා (සැලසුම්) කොමිෂන් සභාවේ පූර්ණකාලීන සේවය කළ යුතුය.

කොමිෂන් සභාවේ කාර්යමණ්ඩලය

-------------------------------------

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 06 | 06 |
| (ii) | තෘතියික මට්ටම | 11 | 06 | 05 |
| (iii) | ද්විතියික මට්ටම | 10 | 07 | 03 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 12 | 12 | - |
| | එකතුව | 45 | 31 | 14 |

**ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ගොඩනැංවීම පිළිබඳ නීතිමය ප්‍රතිපාදන**

**---------------------------------------------------------------------**

(i) පනතේ 2(1) වන වගන්ති ප්‍රකාරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, අධ්‍යාපනයේ සියළු අංශ සම්බන්ධයෙන් වගකිවයුතු සියළු අධිකාරී හා ආයතන විසින් අනුකූලතාවයක් දැක්විය යුතු ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය, ජනාධිපතිවරයා විසින් කලින් කල ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතුය.

(ii) පනතේ 2(3) වන වගන්ති ප්‍රකාරව 3 වන වගනතියෙන් පිහිටුවන ලද ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ජනාධිපතිවරයා වෙත කරනු ලබන නිර්දේශ හා දෙනු ලබන උපදෙස් සැලකිල්ලට ගැනීමෙන් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සකස් කරනු ලැබිය යුතුය.

(iii) 8(1)(අ) වන වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සැලසුම් හෝ සැලසුම් වහා සමාලෝචනය කිරීම සහ පෘථුල ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීමද ඇතුළුව, අධ්‍යාපන ප්‍රතිපත්ති නොකඩවා පවත්වාගෙන යාම සහතික කිරීමේ සහ සමාජයේ වෙනස්වන අවශ්‍යතාවන් ට අධ්‍යාපන ක්‍රමය අනුකූලතාව දැක්වීම හැකි කිරීමේ අදහස ඇතිව, අධ්‍යාපන ප්‍රතිපත්තියේ සියළු ම අංශ සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම.

(iv) 8(1)(ආ) වන වගන්තිය ප්‍රකාරව ක්‍රියාත්මක වෙමින් පවතින ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සැලැස්ම කලින් කල සමාලෝචනය කිරීම සහ විශ්ලේෂණය කිරීම ද අවශ්‍ය විටක ඒ ප්‍රතිපත්තියේ, සැලැස්මේ හෝ සැලසුම්වල ඇති කළ යුතු වෙනස්කම් ජනාධිපතිවරයාට නිර්දේශ කිරීම.

(v) 8(1)(ඇ) වන වගන්තිය ප්‍රකාරවකොමිෂන් සභාවේ උපදෙස් සඳහා ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාව වෙත යොමුකරනු ලැබිය හැකි, අධ්‍යාපනයට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට උපදෙස් දීම.

(vi) 8(2) වන උපවගන්තිය ප්‍රකාරව 8(1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ ඉදිරිපත් කරනු ලැබිය හැක්කේ යම් කාරණා සම්බන්ධයෙන් ද, ඒ කාරණාවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, කොමිෂන් සභාව විසින් පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

(vii) 8(2)(අ) වන උපවගන්තිය ප්‍රකාරව සේවා නියුක්තිවලට, කර්මාන්තවලට හා සාමාජික අවශ්‍යතාවලට සරිලන පරිදි අධ්‍යාපනය සකස් කිරීමෙහිලා අවශ්‍යවන, අධ්‍යාපනික ආයතනවල විෂයමාලාවල හා ඉගැන්වීම් ක්‍රමවල ඇති කළ යුතු වෙනස්කම්

(viii) 8(2)(ආ) වන උපවගන්තිය ප්‍රකාරව අධ්‍යාපනික ආයතනවල ශිෂ්‍යයන්ට ඔවුන්ගේ ස්වශක්තිය පූර්ණාකාරයෙන් වැඩි දියුණු කර ගැනීමට හැකිවන පරිදි ලබාදිය යුතු මාර්ගෝපදේශකත්වයේ හා උපදේශ සේවාවල ප්‍රමාණවත් භාවය.

(ix) 8(2)(ඇ) වන උපවගන්තිය ප්‍රකාරව අධ්‍යාපනික ආයතන හා ප්‍රජාව අතර සම්බන්ධතා ශක්තිමත් කිරීමෙහි ලා අවශ්‍ය වැඩ පිළිවෙළවල්,

(x) 8(2)(ඈ) වන උපවගන්තිය ප්‍රකාරව ප්‍රජාවේ සමස්ත මානුෂික සංවර්ධනය උදෙසා අධ්‍යාපනික ආයතන, සම්පත් මධ්‍යස්ථාන වශයෙන් වැඩි දියුණු කිරීම,

(xi) 8(2)(ඉ) වන උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය වශයෙන් පාසල් අතර පවත්නා අතුල්‍යතා අඩු කිරීමෙහි ලා ගැනීමට අවශ්‍ය පියවර,

(xii) 8(2)(ඊ) වන උපවගන්තිය ප්‍රකාරව ගුරුවරුන්ගේ සහ අධ්‍යාපන සේවා කාර්ය මණ්ඩලයේ වෘත්තීය තත්ත්වය නගා සිටුවීමෙහි ලා ගැනීමට අවශ්‍ය පියවර,

(xiii) 8(2)(උ) වන උපවගන්තිය ප්‍රකාරව ප්‍රාථමික හා ද්විතියික පාසල් නියමිත කාලයට පෙරහැර යන ළමයින්ට, ඔවුන්ගේ ශක්‍යතාව පූර්ණකාරයෙන් වැඩි දියුණු කර ගැනීමට හැකිවන පරිදි ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා සැලැස්විය හැකි විකල්ප වැඩ සටහන්,

(xiv) 8(2)(ඌ) වන උපවගන්තිය ප්‍රකාරව සියළු ජන කොටස්වල සහ ආගම්වල ශිෂ්‍යයන්ගේ සංස්කෘතික හා ආගමික අපේක්ෂාවන් පෝෂණය කිරීමෙහි ලා අවශ්‍ය වන විෂයමාලාවල ඇති කළ යුතු වෙනස්කම්,

(xv) 8(2)(එ) වන උපවගන්තිය ප්‍රකාරව එවැනි යම් නිර්දේශ ක්‍රියාත්මක කිරීමෙහි ලා අවශ්‍ය නීතිමය වෙනස්කම්,

(xvi) පනතේ 9 වන වගන්ති ප්‍රකාරව (2) වන වගන්තිය යටතේ ප්‍රකාශ කර ඇති ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට යටත්ව, යම් ලිඛිත නීතියක් යටතේ, අධ්‍යාපනයට අදාළ යම් විෂයයක් හෝ කර්තව්‍යයක් භාර අමාත්‍යවරයා විසින් හෝ ක්‍රියාත්මක රජයේ නිලධරයෙකු විසින් හෝ ක්‍රියාත්මක කරනු ලැබිය හැකි බලතලවලට හෝ 8 වන වගන්තියෙහි සඳහන් යම් කාරණයකට මේ පනතේ ඇතුළත් කිසිවකින් බලපෑමක් හෝ හානියක් නොවිය යුතුය. නැතහොත් එයින් බලපෑමක් හෝ හානියක් වන්නේ යයි සලකනු නොලැබිය යුතුය.

ඇමුණුම් අංක **04**

**කොමිෂන් සභාවේ බලතල සම්බන්ධ ප්‍රතිපාදන**

**---------------------------------------------------**

(i) පනතේ 10(1)(ආ) වගන්තිය ප්රකාරව කොමිෂන් සභාවේ කර්තව්‍යවලට සමාන කර්තව්‍ය ඉටුකරන ශ්‍රී ලංකාවෙන් බැහැරව පිහිටි සංවිධාන සමඟ සම්බන්ධතා ඇති කර ගැනීම හා පවත්වා ගෙන යාම.

(ii) 10(1)(ඉ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ සහ වෙනත් රටවල අධ්‍යාපනය හා ඊට අදාළ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් තොරතුරු දත්ත බැංකුවක් පිහිටුවා පවත්වාගෙන යාම.

(iii) 10(1)(ඌ) වගන්තිය ප්‍රකාරව අධ්‍යාපනයේ විවිධ ක්ෂේත්‍රවල විශේෂඥතා සමූහ මණ්ඩලයක් නංවාලීමේ අදහස ඇතිව කොමිෂන් සභාවේ නිළදරයන්ගේ හා සේවකයන්ගේ නිපුණතා වැඩි දියුණු කිරීමෙහිලා අවශ්‍ය විය හැකි යම් පියවර ගැනීම.

(iv) පනතේ 10(1)(එ) වන වගන්ති ප්‍රකාරව කොමිෂන් සභාවේ බලතල හා කර්තව්‍ය නිසි ලෙස ඉටු කිරීමෙහි ලා අවශ්‍ය විය හැකි යම් කමිටු, විශේෂඥ කණ්ඩායම් සහ උපදේශක මණ්ඩල පත් කිරීම,

(v) පනතේ 10(1)(ඒ) වන වගන්ති ප්‍රකාරව කොමිෂන් සභාවේ බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමෙහි සහ ඉටුකිරීමෙහි ලා ආනුෂංගික හෝ එහිලා සම්බන්ධ සියලු ක්‍රියා හෝ වෙනත් දේ කිරීම.

**මූල්‍ය ප්‍රතිපාදන**

**----------------**

**(අ) අරමුදල් ලැබීම් - ඒකාබද්ධ අරමුදල**

| ගිණුම් වර්ෂය | විස්තරය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු) | ශුද්ධ වියදම (රු) |
|---|---|---|---|
| 2014 | 2502(ආයෝජන) | 3,500,000 | 2,372,611 |
| 2015 | 2502(ආයෝජන) | 4,000,000 | 198,865 |
| 2016 | 2502(ආයෝජන) | 3,000,000 | 1,442,827 |
| 2017 | 2507(ආයෝජන) | 2,500,000 | 1,163,378 |
| 2018 | 2507-1 (ආයෝජන) | 980,000 | 586,113 |
| 2018 | 2507-2 (ආයෝජන) | 5,200,000 | 4,656,645 |
| 2019 | 2507-1 (ආයෝජන) | 5,000,000 | 2,322,652 |
| 2019 | 2507-2(ආයෝජන) | 1,800,000 | 1,436,658 |
| එකතුව | | 25,980,000 | 14,179,749 |

**(ආ) අරමුදල් ලැබීම්- වෙනත්**

| විස්තරය | වටිනාකම රු. | ලබාදුන් ආයතනය |
|---|---|---|
| 2003-ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා | | මානව සම්පත් සංවර්ධන,අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලෝක බැංකු මූල්‍යාධාර ලබන ගුරු අධ්‍යාපන හා ගුරු ස්ථාපන (TETD) ව්‍යාපෘතිය මඟින් |
| 2016-සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා යෝජනා | මිලියන 5 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය හරහා ලෝක බැංකුවේ දැනුම් කේන්ද්‍රයක් සඳහා පාදකවන්නා වූ පාසල් අධ්‍යාපන පද්ධතියක් ඇතිකිරීම සඳහා වූ ව්‍යාපෘතිය |
| 2018-කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා | මිලියන 1 | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන මඟින් (SSDP) |

ඇමුණුම් අංක 06

**ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් සම්පාදනය කර ජනාධිපතිවරයා වෙත පිළිගන්වන ලද වාර්තා**

| **අනු අංකය** | **විස්තරය** | **වර්ෂය** |
|---|---|---|
| 01. | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පළමුවන වාර්තාව | 1992 |
| 02. | Restructuring the Teachers' Service | 1993 |
| 03. | ගුරු සේවය ප්‍රතිව්‍යුහගත කිරීම, අධ්‍යාපනය පාලනය කිරීම, පොදු අධ්‍යාපනය අනිවාර්ය කිරීම, ඉංග්‍රීසි ඉගෙනුමට ඇති අවස්ථා වැඩි කිරීම හා දියුණු කිරීම. | 1993 |
| 04. | ජාතික අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්තියක් කරා ක්‍රියා උපනෙත ක්‍රමවේදයක් | 1995 |
| 05. | විශ්වවිද්‍යාල අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය | 1996 |
| 06. | සාමාන්‍ය අධ්‍යාපනයේ ප්‍රතිසංස්කරණ | 1997 |
| 07. | විශ්වවිද්‍යාල ප්‍රවේශ ප්‍රතිපත්තිය පිළිබඳව ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කෙරෙන නිර්දේශ | 2000 |
| 08. | Recommendation on National Policy for the development of Technical Education in Sri Lanka | 2002 |
| 09. | ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා | 2003 |
| 10. | Recommendation in Respect of Private School and International Schools | 2003 |
| 11. | 6වන හා 10 වන ශ්‍රේණිවල සිසුන්ගේ භාෂා හා ගණිත නිපුණතා සමීක්ෂණ වාර්තාව | 2006 |
| 12. | උසස් අධ්‍යාපනය සහ කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුව | 2009 |
| 13. | ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලද සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති යෝජනා | 2007 - 2010 |
| 14. | ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සඳහා යෝජනා | 2016 |
| 15. | කාර්මික හා වෘත්තීය  අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය | 2018 |
| 16. | පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය | 2019 |

**ඇමුණුම අංක 07**

**ජනාධිපති කාර්යසාධක බලකාය**

-----------------------------------

| **අනු අංකය** | **සාමාජිකයාගේ නම** | **ආයතනය** |
|---|---|---|
| 1. | ගරු රිචර්ඩ් පතිරණ මැතිතුමා | අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය |
| 2. | ගරු විශ්වා වර්ණපාල මැතිතුමා | අධ්‍යාපන හා උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍ය |
| 3. | මහාචාර්ය ඒ.වී.සුරවීර මැතිතුමා, | සංස්කෘතික කටයුතු පිළිබඳ නියෝජ්‍ය අමාත්‍ය |
| 4. | වෛද්‍ය තාරා ද මැල් මහත්මිය | ජනාධිපති උපදේශිකා |
| 5. | සුනිලා මෙන්ඩිස් මහත්මිය | ගරු ජනාධිපතිනියගේ ජ්‍යෙෂ්ඨ සහකාරලේකම් |
| 6. | ඇන්ඩෘ සිල්වා මහතා | ලේකම්, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය |
| 7. | මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක මහතා | සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව |
| 8. | මහාචාර්ය කේ. ඩී. අරුල්ප්‍රගාසම් මහතා | උප සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව |
| 9. | මහාචාර්ය එස්.පද්මනාදන් මහතා | උප සභාපති,විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව |
| 10. | ලාල් සෙනෙවිරත්න මහතා | ලේකම්, ක්‍රම සම්පාදන හා ජනවාර්ගික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය |
| 11. | අනුර කුමාරසිංහ මහතා | සභාපති, තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව |
| 12. | මහින්ද රණවීර මහතා | විශේෂ උපදේශක, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය |
| 13. | ආචාර්ය පී. අලයිලීමා මහත්මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සැලසුම් අමාත්‍යාංශය |
| 14. | ජේ.පී. හේරත් මහතා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය |
| 15. | ලලනි පෙරේරා මහත්මිය | අතිරේක ලේකම්, අධිකරණ හා ව්‍යවස්ථා කටයුතු අමාත්‍යාංශය |

ඇමුණුම් අංක 08

**1997 වාර්තාව - තාක්ෂණික කමිටු**

**ගුණාත්මක භාවය වර්ධනය කිරීම.**

| අනු අංකය | සාමාජිකයාගේ නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 1. | මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක මහතා | සභාපති | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව |
| 2. | ආචාර්ය පී. අලයිලීමා මහත්මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | ජාතික සැලසුම් අමාත්‍යාංශය |
| 3. | ජේ.පී.හේරත් මහතා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | ජාතික අධ්‍යාපන ආයතනය |
| 4. | ජෙයිමා ඉස්මයිල් මහත්මිය | | |
| 5. | විල්ෆඩ් පෙරේරා මහතා | ජොෂ්ඨ ව්‍යාපෘති නිළධාරි | ජාතික අධ්‍යාපන ආයතනය |
| 6. | මහින්ද රණවීර මහතා | විශේෂ උපදේශක | අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය |

**(1) ඉංග්‍රීසි ඉගැන්වීම**

| අනු අංකය | සාමාජිකයාගේ නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 1. | මහාචාර්ය කේ. ඩී. අරුල්ප්‍රගාසම් මහතා | උප සභාපති | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව |
| 2. | වෛද්‍යා තාරා ද මැල් මහත්මිය | ජනාධිපති උපදේශිකා | |
| 3. | චන්ද්‍ර අමරසේකර මහත්මිය | | |
| 4. | මැණික් ගුණසේකර මහත්මිය | අංශ ප්‍රධානි | ඉංග්‍රීසි දෙපාර්තමේන්තුව |
| 5. | ජෙයිමා ඉස්මයිල් මහත්මිය | | |
| 6. | වයි.එස්.එම්.යටවත්ත මහත්මිය | අධ්‍යක්ෂ | ඉංග්‍රීසි දෙපාර්තමේන්තුව ජාතික අධ්‍යාපන ආයතනය |

**(2)** ඇගයීම

| අනු අංකය | සාමාජිකයාගේ නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 1. | මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක මහතා | සභාපති | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව |
| 2. | ගාමිණී ගුණරත්න මහතා | විභාග කොමසාරිස් ජනරාල් | ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව |
| 3. | ඒ.ඒ. නවරත්න මහතා | අධ්‍යක්ෂ | ඇගයීම්, ජාතික අධ්‍යාපන ආයතනය |
| 4. | ආචාර්ය ලාල් පෙරේරා මහතා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කොළඹ විශ්වවිද්‍යාලය |
| 5. | ජී.කුමාරසිංහ මහතා | විදුහල්පති | රාජකීය විද්‍යාලය |

**(3)** ගුරු අධ්‍යාපනය

| අනු අංකය | සාමාජිකයාගේ නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 1. | මහාචාර්ය ස්වර්ණා ජයවීර මහත්මිය(සභාපති) | සාමාජික | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව |
| 2. | දයා රෝහණ අතුකෝරාල මහතා | | අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 3. | ආචාර්ය ප්‍රේමා කුඩලිගම මහත්මිය | | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය. |
| 4. | මහින්ද රණවීර මහතා | විශේෂ උපදේශක | අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය |
| 5. | මහාචාර්ය එස්. සන්ද්‍රසේකරන් මහතා | සහාය මහාචාර්ය | අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 6. | මහාචාර්ය ස්වර්ණා විජේතුංග මහත්මිය | | අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය |

**(4) අනිවාර්ය අධ්‍යාපනය**

| අනු අංකය | සාමාජිකයාගේ නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 1. | මහාචාර්ය ස්වර්ණා ජයවීර මහත්මිය | සාමාජික | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව |
| 2. | ජයන්ති ගුණසේකර මහත්මිය | අධ්‍යක්ෂ (සැලසුම්) | ජාතික අධ්‍යාපන ආයතනය |
| 3. | ආචාර්ය එස්.ඩී.එල්.අමර ගුණසේකර මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | ජාතික අධ්‍යාපන ආයතනය |
| 4. | පී.වැලිවිට මහතා | අධ්‍යක්ෂ | නොවිධිමත් අධ්‍යාපන ඒකකය, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශය |
| 5. | කමලා අයි. වික්‍රමසිංහ මහත්මිය | අතිරේක ලේකම් | අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශය |

**(5) පූර්ව ළමා අධ්‍යාපනය.**

| අනු අංකය | සාමාජිකයාගේ නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 1. | කමලා පීරිස් මහත්මිය(සභාපති) | සාමාජික | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව |
| 2. | අමරා අමරසිංහ මහත්මිය | ව්‍යාපෘති නිළධාරී | ජාතික අධ්‍යාපන ආයතනය |
| 3. | මහාචාර්ය චන්ද්‍රා ගුණවර්ධන මහතා | අධ්‍යාපන විද්‍යා මහාචාර්ය | මානව හා සමාජ විද්‍යා පීඨය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| 4. | ආචාර්ය ජී.එල්.එස්. නානායක්කාර මහතා | අධ්‍යක්ෂ | ප්‍රාථමික අධ්‍යාපන අංශය, ජාතික අධ්‍යාපන ආයතනය |
| 5. | ආචාර්ය චන්ද්‍රා සදරසිංහ මහත්මිය | ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති නිළධාරී | ජාතික අධ්‍යාපන ආයතනය |
| 6. | එස්. බී.තෝරදෙණිය මහතා | | අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශය |

**(6) පාසල් ප්‍රතිසංවිධාන හා කළමණාකරණය.**

| අනු අංකය | සාමාජිකයාගේ නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 1. | මහාචාර්ය කේ. ඩී. අරුල්ප්‍රගාසම් මහතා | උප සභාපති | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව |
| 2. | ආචාර්ය පී. අලයිලීමා මහත්මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | ජාතික සැලසුම් අමාත්‍යාංශය |
| 3. | එම්. එන්. එදිස්සූරිය මහත්මිය | විදුහල්පති | විශාඛා විද්‍යාලය |
| 4. | සිසිර ලියනගේ මහතා | සහකාර අධ්‍යක්ෂ ජනරාල් | ජාතික අධ්‍යාපන ආයතනය |
| 5. | මහින්ද රණවීර මහතා | විශේෂ උපදේශක | අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය |
| 6. | ආර්.සිවගුරුනාදන් මහත්මිය | විදුහල්පති | රාදනාදන් හින්දු විද්‍යාලය |
| 7. | මහාචාර්ය ස්වර්ණා විජේතුංග මහත්මිය | | අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය |

(7) උපදේශනය සහ වෘත්තීය මාර්ගෝපදේශනය.

| අනු අංකය | සාමාජිකයාගේ නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| ------ | ---------------------- | ---------- | ---------- |
| 1. | ජයසේන බුත්පිටිය මහතා(සභාපති) | අධ්‍යක්ෂ | අධ්‍යාපන කළමණාකරණ දෙපාර්තමේන්තුව,ජාතික අධ්‍යාපන ආයතනය. |
| 2. | මහාචාර්ය පී.ඩබ්. ඇපාසිංහ මහතා | සභාපති | තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව |
| 3. | ආචාර්ය ලක්ෂ්මන් හෙට්ටිආරච්චි මහතා | | |
| 4. | මහාචාර්ය එස්.බී. හෙට්ටිගේ මහතා | | සමාජවිද්‍යා අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 5. | එච්.එච්.කුමාරප්පෙරුම මහත්මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ | ඉංග්‍රීසි කළමණාකරණ, ජාතික අධ්‍යාපන ආයතනය |
| 6. | වෛද්‍ය දියනාත් සමරසිංහ මහතා | සභාපති | ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය |

**(8)** මාධ්‍ය හා අධ්‍යාපන තාක්ෂණය.

| අනු අංකය | සාමාජිකයාගේ නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| ------ | --------------------- | --------- | ---------- |
| 1. | මහාචාර්ය පී.ඩබ්. ඇපාසිංහ මහතා | සභාපති | තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව |
| 2. | ලක්ෂ්මී ගුණරත්න මහත්මිය | | ජාතික අධ්‍යාපන ආයතනය |
| 3. | මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර මහතා | | කැළණිය විශ්වවිද්‍යාලය |
| 4. | මහාචාර්යවී.කේ.සමරනායක මහතා | අධ්‍යක්ෂ | පරිගණක තාක්ෂණ ආයතනය |
| 5. | ආචාර්ය බුද්ධි වීරසිංහ මහතා | අධ්‍යක්ෂ | අධ්‍යාපන තාක්ෂණ |

**(9)** **දැනුවත් කිරීම.**

| අනු අංකය | සාමාජිකයාගේ නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 1. | සුනිලා මෙන්ඩිස් මහත්මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ජනාධිපති ලේකම් කාර්යාලය |
| 2. | වෛද්‍ය තාරා ද මැල් මහත්මිය | ජනාධිපති උපදේශිකා | |
| 3. | බන්දුල පීරිස් මහතා | සහකාර ලේකම් | |
| 4. | සිරිල් ගුණපාල මහතා | අතිරේක ලේකම් | ජනාධිපති ලේකම් කාර්යාලය |
| 5. | ශාන් ජයවර්ධන මහත්මිය | | |
| 6. | අතුල මංචනායක මහතා | | ප්‍රකාශන අංශය,ජාතික අධ්‍යාපන ආයතනය |
| 7. | කේ.අයි.වික්‍රමසිංහ මහතා | අතිරේක ලේකම් | අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශය |

**(10)** **විශ්වවිද්‍යාල ප්‍රවේශ.**

| අනු අංකය | සාමාජිකයාගේ නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 1. | මහාචාර්ය කේ. ඩී. අරුල්ප්‍රගාසම් මහතා | උප සභාපති | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව |
| 2. | සී.අබේගුණවර්ධන මහතා | අතිරේක ලේකම් | උසස් අධ්‍යාපන අමාත්‍යංශය |
| 3. | වෛද්‍ය කාලෝ ෆොන්සේකා මහතා | | වෛද්‍ය පීඨය,කැළණිය විශ්වවිද්‍යාලය |
| 4. | මහාචාර්ය ඩබ්.ඩී.ලක්ෂ්මන් මහතා | උපකුලපති | කොළඹ විශ්වවිද්‍යාලය |
| 5. | මහාචාර්ය එස්.පද්මනාදන් මහතා | උප සභාපති | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව |
| 6. | ආචාර්ය එස්.තිලකරත්න මහතා | සභාපති | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව |

(11) **නීති සම්පාදනය.**

| **අනු අංකය** | **සාමාජිකයාගේ නම** | **තනතුර** | **ආයතනය** |
|---|---|---|---|
| --------- | ----------------------- | ---------- | ----------- |
| 1. | ආර්.එස්.මැදගම මහතා (සභාපති) | ලේකම් | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව |
| 2. | පී.ඩබ්.ගුණසේකර මහතා | අධ්‍යක්ෂ, (PSDP) | SIDA ව්‍යාපෘතිය, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශය |
| 3. | පී.වැලිවිට මහතා | අධ්‍යක්ෂ | විධිමත් අධ්‍යාපන ඒකකය, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශය |

ඇමුණුම් අංක 09

**මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ උපදේශන කමිටුව**

**-----------------------------------------------------**

1 ළමා කටයුතු පිළිබඳ මධ්‍යම ආණ්ඩුවේ අමාත්‍යාංශ ලේකම් (සභාපති ලෙස කටයුතු කිරීමට)

2 ළමා ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ (ලේකම් ලෙස කටයුතු කිරීමට)

3 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති හෝ සභාපතිතුමා විසින් පත් කරනු ලබන විධායක මට්ටමේ නිලධාරීන්

4 මුදල් කොමිෂන් සභාවේ සභාපති හෝ සභාපතිතුමා විසින් පත් කරනු ලබන විධායක මට්ටමේ නිලධාරියෙකු

5 අධ්‍යාපන, මුදල්, සෞඛ්‍ය, සමාජ සේවා සහ පළාත් සභා යන විෂය භාර මධ්‍යම ආණ්ඩුවේ අමාත්‍යාංශ ලේකම්වරු හෝ ලේකම්වරුන් විසින් පත් කරනු ලබන විධායක මට්ටමේ නියෝජිතයින්

6 මුල් ළමාවිය සංවර්ධනයට/පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ පළාත් නියාමන අධිකාරි/ කාර්යාංශ/ ඒකක අධ්‍යක්ෂවරුන් හෝ පළාත් ප්‍රධාන ලේකම්තුමා විසින් පත් කරනු ලබන විධායක මට්ටමේ නියෝජිතයින්

7 ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂ ජනරාල් හෝ අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් පත් කරනු ලබන විධායක මට්ටමේ නියෝජිතයෙක්

8 වතු මානව සම්පත් භාරයේ අධ්‍යක්ෂ ජනරාල් හෝ අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් පත් කරනු ලබන විධායක මට්ටමේ නියෝජිතයෙක්